# 2017 / 2018 මහ පෙර වගා රැස්වීම් තීරණ .

1994 අංක 13 දරණ වාරිමාර්ග ( සංශෝධිත ) පනතේ 05 වන වගන්තියේ 05 වන අනු වගන්තිය අනුව 2017 .09.14 දින පරාක්‍රම සමුද්‍රය නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයේදි පැවති පෙර වගා රැස්වීමේදී පරාක්‍රම සමුද්‍රය මහා වාරිමාර්ග ව්‍යාපාරයේ 2017 / 2018 මහ කන්නය සඳහා යෝජිත වගා කාල සටහන

- වගා රැස්වීම සඳහා යෝජිත දිනය - 2017.10.26.
- වගා කිරීමට අපේක්ෂිත භෝග වර්ග - මාස 3 , 3 ½ වී
- වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය - හෙක්. 10365
- මුල්වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - 2017.11.05
- මුර ජලය ආරම්භ කරන දිනය - 2017.11.20
- අවසන් වරට ජලය නිකුත් කිරීමට යෝජිත දිනය - 2018.02.26
- වගාව පිහිටුවා අවසන් කල යුතු දිනය - 2017.11.20
- ගොවීන් විසින් ඇලවේලි ශුද්ධ කර අවසන් කල යුතු දිනය - 2017.10.25
- ගොවීන් විසින් නියමිත දිනට ශුද්ධ නොකරනු ලබන ඇලවල් ගොවි සංවිධානය විසින් ශුද්ධ කල යුතු දිනය - 2017.10.30
- වගා රක්ෂණය අවසන් කල යුතු දිනය - 2017.11.20
- ට්‍රැක්ටර් හා ගවයින් යායෙන් ඉවත් කල යුතු දිනය - 2017.11.20
- වගාහානි දැණුම් දිය යුතු දිනය - 2018.02.26
- අස්වනු නෙලා අවසන් කල යුතු දිනය - 2018.03.15

1994 අංක 13 ( සංශෝධිත ) දරණ වාරිමාර්ග ආඥා පනත 11 වගන්තියෙහි 1 හා 2 උප වගන්ති අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති .

I. කෙත් ඇලවල් සහ බෙදුම් ඇලවල් වල නඩත්තුව සඳහා අක්කර 01 කට රු 200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුයි .

II. නියමිත දිනට බෙදුම් ඇලවල් සහ කෙත් ඇලවල් වල තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් මීටරයකට රු 100 .00 ක මුදලක් අය කිරීම

III. පිදුරු පිළිස්සීම වෙනුවෙන් අක්කර 1 කට රු 10000.00 ක මුදලක් අය කරනු ඇත .

IV. ජලය නිකුත් කිරීම අවසන් කිරීමට යෝජිත දිනයෙන් පසු ජලය ඉල්ලීම වෙනුවෙන් හෙක්ටයාර් 01 කට රු 250 /= ක මුදලක් අය කිරීම .

V. වාරිමාර්ග නිර්මිත වලට හානි කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනතේ පනවා ඇති නීති අනුව කටයුතු කිරීම .

ඩබ්.ඒ.එම්.ජී බණ්ඩාර ,
නේවාසික ව්‍යාපාර කළමනාකරු .